**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය - 2014**

**-----------------------------------------------------------------**

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ (ජාජසජම) 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ (ජාජසජම) මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1** **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ලං. ගි.ප්‍ර)**

පහත සඳහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් නොපිළිපැදීම් විගණනයේදී නිරීක්ෂණය විය.

**(අ)** **<u>ශ්‍රී.ලං.ගි.ප්‍ර 1, මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>**

වර්ෂය සඳහා ලාභය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයට ගත යුතු වුවද ඒ වෙනුවට සමාලෝචිත වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ රඳවාගත් ඉපැයුම් ලෙස ගෙන තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සමාලෝචිත වර්ෂය සඳහා ලාභය රු.මිලියන 53.71 කින් වැඩියෙන් දක්වා තිබූ අතර ප්‍රත්‍යාගණන සංචිතය ඊට සමාන මුදලකින් අඩුවෙන් දක්වා තිබුණි.

**(ආ)** **<u>ශ්‍රී.ලං.ගි.ප්‍ර 20, රාජ්‍ය ප්‍රදාන සඳහා ගිණුම්කරණය හා රාජ්‍ය අනුග්‍රහයන් හෙළිදරව් කිරීම</u>**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) යාපනය කිලිනොච්චි ජල සම්පාදන ව්‍යාපෘතිය හා ප්‍රජාමූල ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂක වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ලැබුණු විදේශ ප්‍රදාන පිළිවෙළින් රු.මිලියන 447.3 ක් හා රු.මිලියන 167.6 ක් විය. කෙසේ වුවද අදාළ කෙරීගෙන යන වැඩ මණ්ඩලයේ ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ii) වර්ෂ 8 කට වැඩි කාලයක් නොවෙනස්ව පැවති ව්‍යාපෘති 29 කට අදාළ එකතුව රු.මිලියන 10,358.39 ක විදේශ ප්‍රදාන ශේෂ ක්‍රමක්ෂය කිරීමෙන් තොරව 2014 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත කර තිබුණි. එම විදේශ ප්‍රදානවලට අදාළ විස්තර නොමැති වීම හේතුවෙන් ක්‍රමක්ෂය නොකිරීම නිසා මූල්‍ය ප්‍රකාශනවලට වූ බලපෑම විගණනයේදී නිශ්චය කිරීමට නොහැකි විය.

(iii) තවද, විදේශ ප්‍රදාන ලෙස ගිණුම්ගත කරන ලද එකතුව රු.මිලියන 2,457.5 ක් වූ විශේෂිත ව්‍යාපෘතිවලට අදාළව වෙන් නොකරන ලද ගනුදෙනු 2014 දෙසැම්බර් 31 දිනට ක්‍රමක්ෂය කර නොතිබුණි.
"2014 දෙසැම්බර් 31 දිනට හිඟ ණය හා පොලිය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ රජයේ ස්කන්ධයට මාරු කිරීම සඳහා භාණ්ඩාගාරය විසින් අනුමත කළ බව" මේ සම්බන්ධයෙන් මණ්ඩලයේ සභාපති විසින් දන්වා තිබුණි.

(iv) වෙළඳපොල රේටයට අඩු වූ පොලී රේටයකට ප්‍රදානය කරන ලද රජයේ ණය මත මූල්‍ය වාසිය මූල්‍ය ප්‍රකාශනවල රජයේ ප්‍රදාන ලෙස සලකා නොතිබුණි.

"ණය සහ සහනාධාර ණයවලට ඒකාබද්ධිත ප්‍රදාන හා වෙනත් ආධාර සමඟ ණය යෝජනා ක්‍රම සපයන එකම ප්‍රාග්ධන සැපයුම් කොටස් හිමිකරු වන්නේ රජය බවත්, රජය විසින් සපයන සමාන කොන්දේසි පදනම් කරගෙන ණය සපයන සංවිධාන

නොමැති බවත්, එබැවින් රජය විසින් ඉදිරිපත් කරන ලද ණය යෝජනා ක්‍රමවල පොලී රේටයන් පිළිබඳ වෙළෙඳපොල රේටයන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ලබාගත නොහැකි බවත්" මේ සම්බන්ධයෙන් මණ්ඩලයේ සභාපති විසින් දන්වා තිබුණි.

(v) ස්ථාවර වත්කම් ලෙස ලැබුණු රු.මිලියන 39 ක් වූ විදේශ ප්‍රදාන සමාලෝචිත වර්ෂය තුල ක්‍රමක්ෂය කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජංගම බැරකම් හා ආදායම් ගිණුම් යටතේ දක්වා තිබූ එකතුව රු.මිලියන 47.3 ක්වූ හර ශේෂ හා ජංගම වත්කම් හා වියදම් ගිණුම් යටතේ දක්වා තිබූ එකතුව රු.මිලියන 24.1 ක් වූ බැර ශේෂ අසාමාන්‍ය ලෙස දක්වා තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵල හා මූල්‍ය තත්ත්වය විකෘති වී තිබුණි.

(ආ) ණය පදනම මත ලබා දෙන ලද නව ජල සැපයුම් සම්බන්ධතා ගිණුම්ගත කර නොතිබුණි. කෙසේ වුවද ජල පාරිභෝගිකයින්ගෙන් අයකර ගන්නා ලද රු.මිලියන 14.9 ක් වූ මාසික වාරික, නව සම්බන්ධතා ණයගැති පාලන ගිණුමට බැර කර තිබුණි.

(ඇ) පිරිවැය රු.මිලියන 363 ක් වූ ස්පාඤ්ඤ සුනාමි පහසුකම් අරමුදල් යොදාගනිමින් මොරටුව, පානදුර සහ මීගමුව ප්‍රදේශ සඳහා පානීය ජලය පිරිසිදු කිරීම් පහසුකම සැලසුම් කිරීම හා ඉදි කිරීම් ව්‍යාපෘතිය යටතේ 2009 වර්ෂයේදී ඉදිකරන ලද මුහුදු ජලය පිරිසිදු කිරීමේ පිරියත 2014 දෙසැම්බර් 31 දිනට වර්ෂ 5 ක් ඉක්මවා තිබියදීත් ප්‍රාග්ධනිත කර නොතිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.මිලියන 109,865.63 ක් වූ දේපල, පිරියත හා උපකරණ (දේ.පි.උ) සමාන මුදලකින් අඩුවෙන් දක්වා තිබුණි. ජල තුළුමුවෙහි ඇතිවූ ගැටලු හේතුවෙන් 2010 ජුලි සිට එම පහසුකම ක්‍රියාත්මක නොවන බව තවදුරටත් නිරීක්ෂණය විය. කෙසේ වුවද 2010 සිට 2014 කාල පරිච්ඡේදය සඳහා විදුලිබලය, මෝටර් වාහන කුලියට ගැනීම හා කාර්යාල උපකරණ සඳහා වූ සේවා ගිවිසුම් වෙනුවෙන් රු.මිලියන 14.8 ක මුදලක් වැය කර තිබුණි.

(ඈ) පිරිවැය රු.මිලියන 331.86 ක් වූ ජල පොම්ප අමතර කොටස් තොගය පෙර වර්ෂය තුළදී ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කර ඒ අනුව ක්ෂය කිරීම්ද කර තිබුණි. රු.මිලියන 47.26 ක් වූ ක්ෂය කිරීම්වලින් රු.මිලියන 11 ක මුදලක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ ආපසු මාරුකර තිබුණි. මේ අතර එම වත්කම්වලට අදාළ පිරිවැය පෙර වර්ෂ ගැලපීමක් ලෙස ආපසු මාරු කර නොතිබූ අතර එබැවින් 2014 දෙසැම්බර් 31 දිනට දේපල, පිරියත හා උපකරණ යටතේ දැක්වෙන ජල පොම්ප අමතර කොටස් ශේෂය හා සමුච්චිත පිරිවැය පිළිවෙලින් රු.මිලියන 331.86 කින් හා රු.මිලියන 36.26 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) කලාප 6 ක භාවිතා කරන ලද, ඉඩම් දෙකක්, රසායනාගාර තුනක්, එක් ව්‍යුහයක්, තොග මණ්ඩු දෙකක්, ලී බඩු විෂයයන් තුනක් සහ පරිගණක පහක් හා වෙනත් උපකරණ අගය කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඊ) නිම කරන ලද විදේශ මූල්‍යයන ව්‍යාපෘතිවලින් ලැබුණු රු.මිලියන 38.24 ක් වටිනා තොග ගිණුම්ගත කර නොතිබුණි.

(උ) නැවත අයකළ හැකි වැඩ යෝජනා ක්‍රම 20 ක් සම්පූර්ණ කර 2014 දෙසැම්බර් 31 දින ගනුදෙනුකරුවන්ට භාර දී තිබුණද එම යෝජනා ක්‍රමවලට අදාළව නැවත අයකළ හැකි ගනුදෙනුකරු අත්තිකාරම් ගිණුමේ රු.මිලියන 20 ක නිරවුල් නොකළ ශේෂයක් නිරීක්ෂණය විය.

(ඌ) 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවලට ගන්නා ලද තොග ශේෂය රු.මිලියන 5,300.38 ක් වුවද එම දිනට භෞතිකව සත්‍යාපනය කරන ලද ශේෂය රු.මිලියන 5,360.13 ක් විය.

එබැවින් මූල්‍ය ප්‍රකාශනවල 2014 දෙසැම්බර් 31 දිනට දක්වා තිබූ තොග ශේෂය රු.මිලියන 59.75 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන කෙරීගෙන යන වැඩ ශේෂය සහ විදේශ මූල්‍යයන ව්‍යාපෘති 3 ක එක් එක් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අනුරූපී ශේෂ අතර රු.මිලියන 10,969.57 ක ශුද්ධ වෙනසක් නිරීක්ෂණය වූ අතර එය සසඳා නොතිබුණි. තවද මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.මිලියන 149,059.34 ක කෙරීගෙන යන වැඩ ශේෂය, එහි සෘණ ශේෂයන් ඇතුළත් වී තිබූ හෙයින් රු.650,382 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) 2014 දෙසැම්බර් 31 දිනට නිම කර අදාළ පාර්ශවයන්ට භාරදෙන ලද රු.මිලියන 129.1 ක් වටිනා බාහිර ව්‍යාපෘති දෙකක් සහ රු.මිලියන 159.1 ක් පිරිවැය වූ නිම කරන ලද හා ප්‍රාග්ධනිත කරන ලද ව්‍යාපෘති 3 කට අදාළව වියදම් කිහිපයක් කෙරීගෙන යන වැඩවල නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි.

(ඔ) මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් කිරීම සඳහා විමර්ශනය කිරීමෙන් තොරව ව්‍යාපෘති 64 කට අදාළව කෙරීගෙන යන වැඩ යටතේ දැක්වෙන එකතුව රු.මිලියන 1,588 ක් වූ ශේෂ, වර්ෂ 3 සිට 7 දක්වා කාලයක් නොවෙනස්ව පැවතුණි.

(ඕ) රු.මිලියන 3,667.39 ක් වූ නිමකර භාවිතයට ගනිමින් පවතින ජල සම්පාදන ව්‍යාපෘති 109 ක පිරිවැය ප්‍රාග්ධනිත කිරීමෙන් තොරව 2014 දෙසැම්බර් 31 දිනට කෙරී ගෙන යන වැඩවල පැවතුණි.

(ක) කෙරීගෙන යන වැඩවලට අදාළ නොවන රු.මිලියන 669.1 ක් වූ වියදම රත්නපුර ප්‍රාදේශීය කාර්යාලයේ කෙරීගෙන යන වැඩ ශේෂයේ ඇතුළත් කර තිබුණි.

(ග) ජල සම්පාදන යෝජනා ක්‍රම 72 ක ඉදි කිරීම් නිමකර තිබුණද, එම යෝජනා ක්‍රමවලට අදාළ රු.මිලියන 14.19 ක හර ශේෂය හා රු.මිලියන 13.47 ක බැර ශේෂය මූල්‍ය ප්‍රකාශනවල තැන්පතු හා අත්තිකාරම් යටතේ අනුචිත පරිදි දක්වා තිබුණි.

(ජ) ජල සම්පාදන යෝජනා ක්‍රම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ලබා ගන්නා ලද රු.මිලියන 14,705.34 ක් වූ විදේශ ණය 17 ක් සඳහා මහා භාණ්ඩාගාරය සමඟ උප - ණය ගිවිසුම්වලට එළඹ නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස එම ණය පිළිබඳ ණය හා ප්‍රදාන කොටස් විගණනයේදී වෙනම හඳුනාගත නොහැකි විය. තවද 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ණය ශේෂ, ප්‍රදාන, ප්‍රදානවල ක්‍රමක්ෂය හා පොලී වියදම හා වගකීම්වල නිරවද්‍යතාවය හා සම්පූර්ණත්වය තහවුරු කරගත නොහැකි විය.

"අතිරේක ණය ලබා ගැනීම සඳහා මෙම කරුණ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් භාණ්ඩාගාරයට දන්වා තිබූ නමුත් එම ඉල්ලීමට භාණ්ඩාගාරය විසින් යහපත් ප්‍රතිචාරයක් නොදක්වන ලද බවත් එබැවින් මණ්ඩලයට මෙම විමසුම සඳහා පිළිතුරක් සැපයීමට නොහැකි තත්ත්වයක් ඇති බවත් " මේ සම්බන්ධයෙන් මණ්ඩලයේ සභාපති විසින් දන්වා තිබුණි.

(ට) 2010, 2011, 2012, 2013 හා 2014 වර්ෂවල පහත සඳහන් ව්‍යාපෘති සඳහා ලබා ගන්නා ලද එකතුව රු.මිලියන 955.22 ක් වූ ණය මත ගෙවිය යුතු පොලී මුදල් ගිණුම් ගත කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| ව්‍යාපෘතියේ නම | ගෙවිය යුතු පොලී මුදල | අදාළ කාල පරිච්ඡේදය |
|---|---|---|
| | රු.මිලියන | |
| යාපනය කිලිනොච්චි ජල සම්පාදන ව්‍යාපෘතිය | 873.3 | 2012, 2013 වර්ෂ හා 2014 පළමු අර්ධ වර්ෂය |
| අම්පාර දිස්ත්‍රික්කයේ මුදවා නොගත් ප්‍රදේශ සඳහා ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය - අදියර III | 77.24 | 2010 හා 2012 වර්ෂ |

තවද, ආදායම් නොලබන ජලය (NRW), ඉංජිනේරු අධ්‍යයන/ ප්‍රධාන සැලැස්ම පිළිබඳ ව්‍යාපෘතිවලට අදාළව 2013 දෙවන අර්ධ වර්ෂය සඳහා ගෙවිය යුතු පොලියද තහවුරු කර ගිණුම්ගත කර නොතිබුණි.

" 2014 දෙසැම්බර් 31 දිනට හිඟ ණය හා පොලිය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ රජයේ ස්කන්ධයට මාරු කිරීම සඳහා භාණ්ඩාගාරය විසින් අනුමත කරන ලද බව" මේ සම්බන්ධයෙන් මණ්ඩලයේ සභාපති විසින් දන්වා තිබුණි.

(ඞ) තථ්‍ය පොලී ගෙවීම් හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දැක්වෙන පොලී ගෙවීම් අතර රු.මිලියන 17.36 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඣ) නැවත අයකළ හැකි වැඩවලට අදාළව 2014 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 23.48 ක හර ශේෂයක් නිරීක්ෂණය වූයෙන් මූල්‍ය ප්‍රකාශනවල ගනුදෙනුකරු අත්තිකාරම් ශේෂය සමාන මුදලකින් අඩුවෙන් දක්වා තිබුණි.

(ත) පද්ධති දෝෂයක් හේතුවෙන් ලිපිද්‍රව්‍ය තොගයේ වටිනාකම රු.මිලියන 4.5 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ද) නැවත අයකළ හැකි වැඩවලට අදාළව දරන ලද රු.මිලියන 37.53 ක් වූ ඉදිකිරීම් පිරිවැයෙහි ලැබිය යුතු ශේෂය අදාළ ගනුදෙනුකරු අත්තිකාරම්වලට එරෙහිව නිරවුල් කිරීමෙන් තොරව මූල්‍ය ප්‍රකාශනවල තැන්පතු හා අත්තිකාරම් යටතේ අනුචිත පරිදි දක්වා තිබුණි.

(න) තිඹිරිගස්කටුව පොලිස් ස්ථානයෙහි නැවත අයකළ හැකි යෝජනා ක්‍රමය සඳහා රු.මිලියන 4 ක වියදමක් දරා තිබුණද, ලබාගත හැකි වූ තොරතුරු වලට අනුව රු.මිලියන 2 ක් පමණක් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි.

### 2.2.3 නොසැසඳු වෙනස්කම්

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් සහ වෙළඳ ණයගැතියන්, වෙනත් ණයගැතියන් හා ණයගැති රැස් කිරීම් පාලන ගිණුම් උපලේඛන ශේෂයන් අතර පිළිවෙලින් රු.මිලියන 1,181.38 ක්, රු.මිලියන 106.4 ක් හා රු.මිලියන 101.17 ක් වූ වෙනස්කම් නිරීක්ෂණය විය.

(ආ) විදේශ මූල්‍යයන ව්‍යාපෘති 8 කට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.මිලියන 826.25 ක් වූ කෙරීගෙන යන වැඩ ශේෂ ප්‍රාදේශීය සහාය මධ්‍යස්ථාන (Regional Support Centre) විසින් ඉදිරිපත් කරන ලද උපලේඛනවල දැක්වෙන අනුරූපී ශේෂ සමඟ සසඳා නොතිබූ අතර මේ සම්බන්ධයෙන් රු.මිලියන 30.40 ක් වූ ශුද්ධ වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ප්‍රාග්ධනිත කරන ලද කෙරීගෙන යන වැඩ ශේෂයන් විදේශ මූල්‍යයන ව්‍යාපෘති 6 ක් සඳහා ප්‍රාදේශීය සහාය මධ්‍යස්ථාන විසින් ඉදිරිපත් කරන ලද උපලේඛනවල දැක්වෙන ප්‍රාග්ධනිත ප්‍රමාණයන් සමඟ සසඳා නොතිබුණි. එබැවින් රු.මිලියන 32.69 ක ශුද්ධ වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) කළුතර, මහනුවර හා අනුරාධපුරය ප්‍රදේශවල මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන නැවත අයකළ හැකි වැඩ වටිනාකම හා අදාළ උපලේඛනවල දැක්වෙන අනුරූපී ශේෂයන් අතර රු.මිලියන 3.97 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂ හා අදාළ අත්තිකාරම් ගිණුම් උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.759,187 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) විකුණුම්වලින් ලැබෙන ආදායමට අදාළව තොරතුරු මණ්ඩලයේ වාණිජ අංශය විසින් පවත්වනු ලැබේ. කෙසේ වුවද මණ්ඩ විකුණුම්, තොග සැපයුම් හා බවුසර් සැපයුම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සංඛ්‍යා හා අදාළ අංශයන් විසින් පවත්වනු ලබන වාර්තාවල දැක්වෙන සංඛ්‍යා අතර පිළිවෙලින් රු.මිලියන 57 ක්, රු. 276,000 ක් හා රු.මිලියන 2.4 ක් වූ සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය විය.

(ඊ) සමාලෝචිත වර්ෂය සඳහා කළුගඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ණය පොලිය හා මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අතර රු.886,102 ක නොසැසඳු ශේෂයන් නිරීක්ෂණය විය.

### 2.2.4 හඳුනා නොගත් ශේෂ

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනටත් හඳුනා ගත යුතුව පවතින මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් හා ජංගම බැරකම් යටතේ දැක්වෙන හඳුනා නොගත් දිගුකාලීන හිඟ හර හා බැර ශේෂයන් පිළිවෙලින් රු.මිලියන 236.23 ක් හා රු.මිලියන 190.26 ක් විය. මීට අමතරව එකතුව රු.මිලියන 7,263.59 ක් වූ අක්‍රීය හා වෙනත් හඳුනා නොගත් ශේෂයන් ලෙස දැනටමත් වර්ගීකරණය කරන ලද ශේෂයන් කිහිපයක් පැවති අතර එම ශේෂ 2014 දෙසැම්බර් 31 දිනටද පැවතුණි.

(ආ) 1996 සිට 2004 දක්වා කාල පරිච්ඡේදයේ සිට ගිණුම්වල පැවති එකතුව රු.මිලියන 37.75 ක් වූ හඳුනා නොගත් ශේෂයන් සම්බන්ධයෙන් පියවර ගෙන නොතිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ රැස් කිරීම් පාලන ගිණුම් දෙකක රු.මිලියන 11 ක් හා රු.මිලියන 43.2 ක් වූ පිළිවෙලින් හර හා බැර ශේෂයන් වර්ෂ 3 කට වැඩි කාලයක් නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි. අභ්‍යන්තර මුදල් මාරු කිරීම් පාලන ගිණුම් වර්ෂය අවසානයේ නිරවුල් කළ යුතු වුවද, රු.1,028,061 ක් හා රු.232,146 ක් වූ හර හා බැර ශේෂයන් වර්ෂ 3 කට වැඩි කාලයක් පැවතුණි.

(ඇ) එකතුව රු.මිලියන 2.17 ක් වූ හඳුනා නොගත් ශේෂයන් හඳුනා ගැනීමෙන් හා නිරවුල් කිරීමෙන් තොරව රත්නපුර හා මාතර කලාප ගිණුම්වල දිගු කාලයක් පැවතුණි.

### 2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 සිට 2006 දක්වා කාල පරිච්ඡේදය සඳහා සහ 2009 වර්ෂය සහ 2011 වර්ෂය සඳහා පිළිවෙලින් රු.මිලියන 5.33 ක්, රු.මිලියන 6 ක් හා රු.මිලියන 3.19 ක් වූ ගෙවිය යුතු එකතු කළ අගය මත බදු 2015 දෙසැම්බර් 31 වන විටත් ගෙවා නොතිබුණි.

"පැහැදිලි කිරීමක් ලබා ගැනීම සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ලිපියක් යවන ලද අතර ඒ සඳහා ප්‍රතිචාරයක් මෙතෙක් ලැබී නැති බව" මේ සම්බන්ධයෙන් මණ්ඩලයේ සභාපති විසින් දන්වා තිබුණි.

(ආ) එකතුව රු.මිලියන 1,295.09 ක් වූ වෙළඳ ණයගැති ශේෂ, ණයගැති රැස්කර ගැනීම්, මලාපවහන ණයගැතියන්, නව සම්බන්ධතා ණයගැතියන්, කොළඹ මහනගර සභා ණයගැතියන් හා වෙනත් ණයගැති ශේෂයන් අයකර ගැනීමෙන් තොරව වර්ෂ 3 කට වැඩි කාලයක් පැවතුණි.

(ඇ) මාර්ග සංවර්ධන අධිකාරිය (RDA), පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය (PRDA) හා නගර සභාවල මණ්ඩලය විසින් තබා ඇති රු.මිලියන 17.93 ක් වූ කෙටි කාලීන තැන්පතු 1999 වර්ෂයේ සිට අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

(ඇ) 2002 වර්ෂයට පෙර එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයට ලබාදෙන ලද රු.මිලියන 19.61 ක්වූ අත්තිකාරම් 2015 ජුලි අවසානය වන විටත් නිරවුල් කරගෙන නොතිබුණු අතර මණ්ඩලය විසින් ඒ සඳහා කිසිදු අය කිරීම් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඉ) ඉඩමක් අත්පත් කරගෙන තිබුණද, එම ඉඩම අත්කර ගැනීම සඳහා 2010 සිට 2012 දක්වා කාලපරිච්ඡේදය තුළ ලබා දෙන ලද රු.මිලියන 2.17 ක් වූ අත්තිකාරම් අය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඊ) 1999 සිට 2013 දක්වා කාලපරිච්ඡේදය තුළ කොන්ත්‍රාත්කරුවකුට ලබාදෙන ලද රු.මිලියන 47.54 ක අත්තිකාරමක් අයකරගෙන නොතිබුණි.

(උ) 1995 සිට 2009 දක්වා කාල පරිච්ඡේදය තුළ මිලදී ගැණුම් සඳහා නිලධාරීන්ට හා ආයතනයන්ට ලබාදෙන ලද රු. 248,165 ක් වූ අත්තිකාරම් 2015 ජුලි අවසානය වන විටත් නිරවුල් කර නොතිබුණි.

**2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| | විෂයය | වටිනාකම<br>රු.මිලියන | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | කෙටි කාලීන ආරක්ෂක තැන්පතු ශේෂයන් | 26.67 | විස්තරාත්මක උපලේඛන |
| (ආ) | නොගෙවන ලද එකතු කළ අගය මත නිමැවුම් බදු (ප්‍රාදේශීය කාර්යාල තුනක්) | 27.22 | නොගෙවීම සඳහා හේතු |
| (ඇ) | එකතු කළ අගය මත බදු ගිණුමේ හර ශේෂය (බස්නාහිර මධ්‍යම ප්‍රාදේශීය සහාය මධ්‍යස්ථාන) | 9.36 | නිරවුල් නොකිරීම සඳහා හේතු |
| (ඈ) | නැවත අයකළ හැකි වැඩ සඳහා ගනුදෙනුකරු අත්තිකාරම් | 2.73 | විස්තරාත්මක උපලේඛන |
| (ඉ) | විදේශ මූල්‍යායන ව්‍යාපෘති 57 ක අර්ධ වාර්ෂික පොලී | | ගණනය කිරීම් ක්‍රමය |
| (ඊ) | නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘතියේ දිගු කාලීන හිඟ ණය ශේෂ - ආ ස බැ | 20.71 | නොගෙවීමට හේතු |
| (උ) | ව්‍යාපෘති 30 ක ඇස්තමේන්තුගත පිරිවැය | 29,010 | අමාත්‍ය මණ්ඩල තීරණය |
| (ඌ) | උතුරු කොළඹ නාගරික ජල සම්පාදන ව්‍යාපෘතියේ (පැකේජ - 01) හා රුහුණුපුර ජල සම්පාදන ව්‍යාපෘතියේ (දේශීය බැංකු ණය මඟින් සිදු කරන ලද) පිරිවැය | 6,808.97 | කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම පිළිබඳ ලංසු ඇගයීම් වාර්තා හා විස්තර |

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) මුදල් රෙගුලාසි 387 | ජංගම ගිණුම් 8 කට අදාළව එකතුව රු.මිලියන 96.47 ක අයිරා ශේෂයන් මුදල් පොත්වල නිරීක්ෂණය විය. |

| | |
|---|---|
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය 8.3.9 ඡේදය | (i) ප්‍රජා හා ජල සම්පාදන සේවා පිළිබඳ තෙවන ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ වියදම් දැරීම සඳහා විදේශ මූල්‍යයන ව්‍යාපෘති පහකින් රු.මිලියන 9.4 ක මුදලක් ලබාගෙන තිබුණි. කෙසේවුවද, මෙම වියදම දැරීම ව්‍යාපෘති අරමුණුවලට පටහැනි වූ අතර ඉහත කාර්යයන් සඳහා ව්‍යාපෘති අරමුදල් උපයෝජනය කිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| | (ii) මෝටර් වාහන 11 ක් රේඛීය අමාත්‍යාංශයට මුදා හැර තිබූ අතර මෙම වාහනවල බලපත්‍ර හා රක්ෂණ ඔප්පු අලුත් කිරීම සඳහා මණ්ඩලය විසින් රු.1,108,564 ක මුදලක් දරා තිබුණි. |
| | (iii) චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළ සේවකයන් 7 දෙනෙකු රේඛීය අමාත්‍යාංශයට මුදා හැර තිබුණි. |
| (ඇ) 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | මණ්ඩලයේ බඳවා ගැනීමේ හා උසස්වීම් පරිපාටිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඈ) මණ්ඩලයේ ගබඩා කළමනාකරණ මාර්ගෝපදේශ | යල් පැනගිය විෂයයන් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු මාස 3 ක් ඇතුළත අපහරණය හෝ විනාශ කිරීම සිදුකළ යුතු වුවද රු.මිලියන 14.66 ක් වටිනා යල්පැනගිය තොග 2014 දෙසැම්බර් 31 දිනට වර්ෂ 2 කට වැඩි කාලයක් තොගයේ පැවතුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1. මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ වැඩකටයුතුවලින් වූ ප්‍රතිඵලය රු.මිලියන 1,425.29 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය රු.මිලියන 1,049.39 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 375.9 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී මණ්ඩගත ජල විකුණුම් ආදායම හා නව සම්බන්ධතා ආදායම සැලකිය යුතු ලෙස ඉහළ යාම මූල්‍ය ප්‍රතිඵලයේ මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-----------------------------------

මූල්‍ය ප්‍රතිඵලයේ විවිධ අදියරයන්හි සාරාංශයක් පහත සඳහන් වගුවෙන් දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | | |
|---|---|---|---|---|
| | **2014** | **2013** | **විචලනය** | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | ප්‍රතිශතය |
| ආදායම | 18,710.05 | 17,216.62 | 1,493.43 | 8.67 |
| විකුණුම් පිරිවැය | (11,325.83) | (10,156.77) | (1,169.06) | 11.51 |
| **දළ ලාභය** | 7,384.22 | 7,059.85 | 324.37 | 4.59 |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් හා ප්‍රතිලාභ | 1,390.07 | 1,195.41 | 194.66 | 16.28 |
| පරිපාලන වියදම් | (5,985.33) | (5,832.37) | (152.96) | 2.62 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | (334.37) | (559.43) | (225.06) | 40.23 |
| **මෙහෙයුම් ලාභය (පාඩුව)** | 2,454.59 | 1,863.46 | 591.13 | 31.72 |
| මූල්‍ය ආදායම් | 213.24 | 225.69 | (12.45) | (5.52) |
| මූල්‍ය පිරිවැය | (1,242.53) | (1,039.76) | (202.77) | 19.50 |
| **බදු පූර්ව ලාභය / (පාඩුව)** | 1,425.3 | 1,049.39 | 375.91 | 35.82 |
| බදු | (53.11) | (47.47) | (5.64) | 11.88 |
| වර්ෂයේ ලාභය / **(පාඩුව)** | 1,372.19 | 1,001.92 | 370.27 | 36.96 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දළ ලාභය සහ වෙනත් මෙහෙයුම් ආදායම හා ප්‍රතිලාභ පිළිවෙලින් සියයට 4.59 කින් හා සියයට 16.28 කින් වර්ධනය වී තිබුණු අතර අනෙකුත් මෙහෙයුම් වියදම් සියයට 40.23 කින් අඩු වී තිබුණි. මෙම හිතකර බලපෑම සියයට 2.62 කින් පරිපාලන වියදම් වැඩිවීම හා සියයට 19.50 කින් මූල්‍ය පිරිවැය වැඩිවීම කළමනාකරණය කරගැනීම කෙරෙහි ප්‍රමාණවත් ශක්තියක් ලබා දී තිබුණි.

(ආ) 2013 වර්ෂයේදී රු.709,319 ක් වූ එක් සේවකයෙකුට වූ දායකය 2014 වර්ෂයේදී සියයට 0.69 කින් අඩු වී තිබුණි. 2013 වර්ෂයේදී රු.100,759 ක්වූ එක් සේවකයෙකුට වූ ශුද්ධ ලාභය 2014 වර්ෂයේදී රු.136,019 දක්වා වැඩි වී තිබූ අතර සියයට 35 ක වැඩි වීමක් එයින් නිරූපණය විය.

(ඇ) 2013 වර්ෂයේදී පරිභෝජනය කරන ලද ජල ඒකකයක් සඳහා රු.44.74 ක් වූ ආදායම 2014 වර්ෂයේදී සියයට 1.77 කින් වැඩි වී තිබූ අතර 2013 වර්ෂයේදී පරිභෝජනය කරන ලද ජල ඒකකයක් සඳහා රු.26.24 ක්වූ නිෂ්පාදන වියදම 2014 වර්ෂයේදී සියයට 5 ක වැඩිවීමක් නිරූපණය කරමින් රු.27.56 දක්වා වැඩි වී තිබුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### (අ) මූල්‍ය කාර්යසාධනය

මණ්ඩලය විසින් ජල සම්පාදන යෝජනා ක්‍රම වෙනුවෙන් මහා භාණ්ඩාගාරය හරහා ලබාගෙන තිබුණු සමස්ත විදේශ ණය ශේෂය 2014 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 41,156 ක් හෙවත් මුළු වත්කම්වලින් සියයට 14.55 ක් විය. පහත විග්‍රහ කර ඇති පරිදි, 2014 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ණය වාරික රු.මිලියන 6,353 ක් වූ අතර, ඒ අනුව ප්‍රමාද කාලය වෙනුවෙන් ගෙවා තිබුණු අතිරේක ණය පොලිය රු.මිලියන 245 ක් විය.

| වර්ෂය | හිඟහිටි ණය වාරික | | | නියමිත දිනට ණය පොලිය නොගෙවීම නිසා ගෙවූ අතිරේක පොලිය |
|---|---|---|---|---|
| | ප්‍රාග්ධන කොටස | පොලිය | එකතුව | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 2014 | 1,078 | 2,349 | 3,427 | - |
| 2013 | 1,005 | 563 | 1,568 | 60 |
| 2012 | 990 | - | 990 | 119 |
| 2011 | 368 | - | 368 | 66 |
| එකතුව | 3,441 | 2,912 | 6,353 | 245 |

#### (ආ) නැවත අයකළ හැකි වැඩ ක්‍රියාත්මක කිරීම

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) නැවත අයකළ හැකි වැඩ යනු කෙටිකාලයක් තුළදී එනම් බොහෝ අවස්ථාවලදී වර්ෂ එකකට අඩු කාලයකදී සම්පූර්ණ කළ හැකි කාර්යයන් වේ. කෙසේ වුවද 2014 දෙසැම්බර් 31 දිනට වර්ෂ දෙකකට වැඩි කාලයක් ඉක්මවූ භාරගන්නා ලද නැවත අයකළ හැකි වැඩ 130 ක් පිළිබඳව ගනුදෙනුකරුවන්ගෙන් ලබා ගන්නා ලද එකතුව රු.මිලියන 419.33 ක අත්තිකාරම් කිසිදු වෙනසකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මේ අතර ප්‍රගති වාර්තා සහ එක් එක් කාර්යයන්ට අදාළව ප්‍රමාදයන් සඳහා හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2010 සිට 2014 දක්වා කාල පරිච්ඡේදය සඳහා අත්තිකාරම් ලෙස රු.මිලියන 39.14 ක මුදලක් ලැබී තිබුණද නැවත අයකළ හැකි වැඩ යෝජනාක්‍රම 11 ක ඉදිකිරීම් වැඩ සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් ආරම්භ කර නොතිබුණි.

#### (ඇ) පිරිසිදු ජලය නිෂ්පාදනය හා බෙදා හැරීම

2013 වර්ෂයේ නිෂ්පාදනය කර තිබූ පිරිසිදු ජලය ඝණ මීටර් මිලියන 547 සමඟ සැසඳීමේදී සියයට 5.12 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් 2014 වර්ෂය තුළදී පිරිසිදු ජලය ඝණ මීටර්

මිලියන 575 ක් මණ්ඩලය විසින් නිෂ්පාදනය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට ලබාදෙන ලද ජල සම්බන්ධතා සංඛ්‍යාව 124,251 ක් වූයෙන් පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 3.35 ක වැඩි වීමක් දැක්වුණි.

**(ඇ) ආදායම් නොලබන ජලය (ආ.නො.ජ)**

-----------------------------------

ආදායම් නොලබන ජලය හේතුවෙන් මණ්ඩලය විසින් දරන ලද පාඩුව වෙනම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබූ නමුත්, සාමාන්‍ය පිරිවැයක් ලෙස ගිණුම්වලට ඇතුළත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ හතර සඳහා ආදායම් නොලබන ජලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විස්තරය | 2014 | 2013 | 2012 | 2011 | 2010 |
|---|---|---|---|---|---|
| ජල නිෂ්පාදනය (ඝණ මීටර්) | 574.99 | 547.0 | 525.6 | 490.0 | 469.0 |
| ජල පරිභෝජනය (ඝණ මීටර්) | 410.92 | 381.6 | 368.5 | 344.5 | 321.5 |
| ආදායම් නොලබන ජලය (ඝණ මීටර්) | 164.07 | 165.4 | 157.1 | 145.5 | 147.5 |
| ජල නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස ආදායම් නොලබන ජලය | 28.53 | 30.24 | 29.89 | 29.69 | 31.45 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ජලය කාන්දු වීම්, නීත්‍යානුකූල නොවන ජල සැපයුම් සම්බන්ධතා, නොමිලේ සැපයුම් සහ පරිපාලනමය කරුණු ආදිය හේතුවෙන් 2014 වර්ෂයේදී මණ්ඩලය විසින් නිෂ්පාදනය කරන ලද ජල ප්‍රමාණයෙන් ආදායම් නොලබන ජලය සියයට 28.53 කින් නියෝජනය විය. 2014 වර්ෂයේදී කොළඹ නගරයේ ආදායම් නොලබන ජලය සියයට 46.65 ක් විය.

(ii) පසුගිය කාල පරිච්ඡේදය තුළදී නීත්‍යානුකූල නොවන සම්බන්ධතා අවම කිරීමට හා ජලය බෙදාහැරීම් මාර්ගවල තාවකාලික බිඳවැටීම් අලුත්වැඩියා කිරීමේ ක්‍රම කඩිනම් කිරීමට පියවරයන් කිහිපයක් මණ්ඩලය විසින් ගෙන තිබුණද, 2011 වර්ෂයට සාපේක්ෂව ප්‍රවර්තන වර්ෂයේදී ආදායම් නොලබන ජලය අනුපාතය සියයට 12.76 කින් වැඩි වී තිබුණි.

(iii) වර්ෂ 75 කට වඩා පැරණි කොළඹ නගරයේ ප්‍රධාන ජල බෙදාහැරීම් පද්ධති නවීකරණය කිරීමේ අවශ්‍යතාවයක් පවතින හෙයින් එම කාර්යය සඳහා සැලසුම් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ අත්‍යවශ්‍ය තත්ත්වය කෙරෙහි, මණ්ඩලයේ විශේෂ අවධානය යොමු වී ඇත. වර්තමානයේදී මේ සම්බන්ධයෙන් විදේශ මූල්‍යයන ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මකව පැවතියද, ප්‍රධාන ජල නළයන්හි ප්‍රමාණවත් ප්‍රතිසංස්කරණයක් එයින් සපුරා ගෙන නොතිබුණි. ජල කාන්දුවීම් හේතුවෙන් ආදේශ කළ යුතු ප්‍රධාන ජලය බෙදාහැරීම් නළ මේ දක්වා විශේෂිතව හඳුනාගෙන නොතිබුණි. ප්‍රධාන ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනාවන් සිදු කර තිබුණද, ඒවා ක්‍රියාත්මක කිරීම මන්දගාමී මට්ටමක විය.

(iv) කොළඹ නගරය හැර අනිකුත් ප්‍රදේශවල ආදායම් නොලබන ජලය අඩුකර ගැනීම සඳහාද මණ්ඩලයේ අවධානය ප්‍රමාණවත් නොවූ අතර සංයුක්ත සැලැස්මේ ඇතුළත් ඉලක්ක තාත්වික නොවන බව නිරීක්ෂණය විය.

(v) ආදායම් නොලබන ජලය අඩුකර ගැනීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 3,100.17 ක් සහිතව ව්‍යාපෘති 6 ක් ආරම්භ කර තිබුණද, සැලකිය යුතු අඩුවීමක් හඳුනාගත නොහැකි විය.

**(ඉ) මලාපවහන පද්ධතිය**

රටේ ආර්ථික සංවර්ධනයත් සමඟ ඇති වූ නාගරීකරණය හේතුවෙන් නගරවල මලාපවහන බැහැර කිරීමේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය පැන නැගී තිබුණු අතර එම පහසුකම් සැපයීම මණ්ඩලයේ වගකීම වුවද මෙම අංශයෙහි ප්‍රමාණවත් ප්‍රගතියක් මෑත වර්ෂවල පෙන්නුම් කර නොතිබුණි. ජාතික ප්‍රතිපත්තියක් වශයෙන් ජනගහනයෙන් සියයට 7 කට මලාපවහන බැහැර කිරීමේ පහසුකම් සැපයීමට අපේක්ෂා කර තිබුණද, මෙම ඉලක්කය සපුරා ගැනීම පිළිබඳ පරීක්ෂා කිරීමට අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ඊ) විදේශ මූල්‍යයන ව්‍යාපෘති**

මණ්ඩලය විසින් දේශීය හා විදේශීය අරමුදල් යොදා ගනිමින් ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා සැපයීමේ ව්‍යාපෘති බොහෝ ගණනක් ක්‍රියාත්මක කර තිබුණි. කෙසේ වුවද මේ සම්බන්ධයෙන් පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(i) මහා පරිමාණ විදේශාධාර ව්‍යාපෘති බොහොමයක් නියමිත දිනට සම්පූර්ණ කර නොතිබූ අතර, ව්‍යාපෘති කාලපරිච්ඡේදය දීර්ඝ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අතිරේක වැඩ හා මිල ගණන් ඉහළ යාම හේතුවෙන් පිරිවැය ඉතා ඉහළ අගයකින් වැඩි වී තිබුණි.

(ii) එම ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා ඒකාකාරී ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුගමනය කර නොතිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාක්කපල්ලිය ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා ජල කුළුණක් හා නිල නිවාසයක් ඉදිකිරීමට හෙක්ටයාර් 0.3895 ක ඉඩමක් 1994 මැයි මාසයේදී මණ්ඩලය විසින් අත් කර ගෙන තිබුණි. ඉඩමේ ප්‍රමාණයෙන් පර්චස් 9.5 ක් උපයෝජනය කර ව්‍යාපෘතිය සම්පූර්ණ කර තිබූ අතර ඉඩමේ ඉතිරි කොටස 2015 දෙසැම්බර් 31 වන විටත් ප්‍රාදේශීය සභාවට මාරුකර නොතිබුණි.

(ආ) යාපනය කිලිනොච්චි ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය කාර්යාලය හා කට්ටුඩායි ජලාශය ඉදිකිරීම සඳහා මානිපායි කට්ටුඩායි ප්‍රදේශයේ ඉඩම් දෙකක් අත්පත් කර ගැනීම සඳහා කටයුතු 2010 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. එසේ වුවද 2015 දෙසැම්බර් 31 වන විටත් ඉඩම් අත්පත් කර ගැනීම සම්පූර්ණ කර නොතිබුණි. එබැවින් 2010 සිට 2014 දක්වා කාලපරිච්ඡේදය තුළ තක්සේරු වටිනාකම රු.මිලියන 6.17 සිට රු.මිලියන 9.52 දක්වා වැඩි වී තිබුණි.

(ඇ) රු.මිලියන 3.2 ක් වැය කරමින් ස්ථාපනය කරන ලද අළුතින් හඳුන්වාදෙන ලද පරිගණකගත ඉන්වෙන්ට්‍රි කළමනාකරණ පද්ධතිය මඟින් ප්‍රමාණවත් තොරතුරු උත්පාදනය නොකිරීම හේතුවෙන්, ප්‍රධාන ගබඩාවේ (C අංශය) DI නළ සම්බන්ධයෙන් තොග ලෙජර ශේෂය හා පරිගණකගත ඉන්වෙන්ට්‍රි පද්ධති ශේෂය අතර රු.මිලියන 9.60 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් නොලබන ජලය මුළු නිෂ්පාදනය ඝණ මීටර් 164.07 ක් විය. එම ආදායම් නොලබන ජලය සඳහා මුළු සෘජු වියදම රු.මිලියන 1,291.29 ක් පමණ බව නිරීක්ෂණය වූ අතර එය මණ්ඩලයට පාඩුවක් විය.

(ඉ) මාසයක ඇස්තමේන්තුගත බිල්පත්‍ර පිළිබඳ සිදුකරන ලද විගණන පරීක්ෂණයට අනුව අක්‍රීය ජල මණු සඳහා නව සම්බන්ධතා 11,004 ක් අතුරින් 8,795 ක් සඳහා ඇස්තමේන්තුගත බිල්පත්‍ර නිකුත් කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. එබැවින් ජල මණු සම්මත මට්ටමක නොවූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඊ) 2008 වර්ෂයේදී ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන සහයෝගීතා නියෝජිතායතනය විසින් (SIDA) මූල්‍යයනය කරන ලද මොරටුව/ රත්මලාන හා ජාඇල/ ඒකල අප ජලය අපහරණය කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳ කොන්ත්‍රාත්තුව, කොන්ත්‍රාත්කරුගේ බූන්වත්භාවය හේතුවෙන් 2013 වර්ෂයේදී නවතා දමා තිබුණි.

ඉහත කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් විදේශීය බැංකුවකින් නිකුත් කරන ලද කාර්යසාධන බැඳුම්කරය හා රඳවාගැනීම් බැඳුම්කරය භාරගන්නා අවස්ථාවේදී දේශීය බැංකුවක් විසින් සනාථ කිරීමක් ලබා ගැනීම සඳහා ව්‍යාපෘතිය විසින් 2006 ප්‍රසම්පාදන අත්පොතේ විධිවිධානයන්ට අනුකූල වී නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද එජඩො මිලියන 9.06 ක් වටිනා කාර්යසාධන බැඳුම්කරය සහ එජඩො මිලියන 7.96 ක් වටිනා රඳවා ගැනීම් බැඳුම්කරය මුදල් කර ගැනීමට ව්‍යාපෘතියට නොහැකි වී තිබුණි. ඉහත සඳහන් දුර්වලතා අනුව දේශීය නෛතික ක්‍රියාමාර්ගයක් ආරම්භ කිරීමට ව්‍යාපෘතිය කටයුතු කර නොතිබූ අතර ජාත්‍යන්තර නෛතික ක්‍රියාමාර්ගයන් සඳහා ඇතුළත් වූ බවට සාක්ෂිද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඉහත සඳහන් අඩුපාඩුවලට අමතරව, ඉහත සඳහන් කොන්ත්‍රාත්තුවෙන් මණ්ඩලයට වූ පාඩුව තහවුරු කරගෙන නොතිබූ අතර එහි වගකීම 2015 ජුලි 31 වන විටත් පවරා නොතිබුණි.

## 4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රු.මිලියන 11.34 ක් වටිනා ජල මණු හා රු.මිලියන 39.92 ක් වටිනා D1 නළ චලනය නොවන හා සෙමින් චලනය වන තොග ලෙස ප්‍රධාන ගබඩාවේ දීර්ඝ කාලයක් පැවතුණි.

(ආ) මණ්ඩලයට සුනාමි ප්‍රදාන යටතේ ලැබුණු රු.මිලියන 24.18 ක් වටිනා තොග කිසිදු කාර්යයකට යොදා නොගෙන ප්‍රධාන ගබඩාවල දිගු කාලයක් පැවතුණි.

(ඇ) රු.මිලියන 368 ක් වටිනා චලනය නොවන තොග හා රු.මිලියන 328 ක් වටිනා සෙමින් චලනය වන තොග 2014 දෙසැම්බර් 31 දිනට තොගයේ පැවති බව නිරීක්ෂණය විය. එය මණ්ඩලයේ මුළු තොග වටිනාකමින් සියයට 12.39 කින් නියෝජනය විය.

(ඈ) රු.මිලියන 9.9 ක් වටිනා අත්හැර දැමූ වත්කම් හා රු.මිලියන 4.14 ක් වටිනා කඩා දැමූ වත්කම් විධිමත් පියවරක් ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 17.95 ක්වූ මාර්ගස්ථ තොග ශේෂය විමර්ශනය කිරීමෙන් තොරව වර්ෂ 2 කට වැඩි කාලයක් පැවතුණි.

(ආ) මහා භාණ්ඩාගාරයෙන් විශේෂ අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව විදේශ මූලායන ව්‍යාපෘති වෙනුවෙන් මණ්ඩලය විසින් දරන ලද පොදුකාර්ය වියදම් ලෙස ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ මුළු මාසික වැටුපෙන් සියයට 20 ක් මණ්ඩලය විසින් අයකර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ එසේ අයකරන ලද මුළු පොදු කාර්ය වියදම රු.මිලියන 444.44 ක් විය.

(ඇ) පිරිවැය ඇස්තමේන්තු කිරීම වෘත්තිමය සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලයක් විසින් අනුමත රේටයන් පදනම් කරගෙන සිදුකර තිබුණද, දේශීය බැංකු ණය මඟින් මූලායනය කරන ලද ජල සැපයුම් ව්‍යාපෘති 5 ක ආරම්භක ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 15,286 කින් හෙවත් සියයට 122 සිට සියයට 338 ක පරාසයකින් වැඩි වී තිබුණි.

(ඈ) අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබාගැනීම මත ජල සම්පාදන ව්‍යාපෘති 6 ක ආරම්භක පිරිවැය රු.මිලියන 15,746 කින් වැඩි කර තිබුණි.

(ඉ) කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණද, රු.මිලියන 8,400 ක් පිරිවැය වූ ජල සම්පාදන ව්‍යාපෘති 4 කට අදාළව ණය ගිවිසුම් දේශීය බැංකු සමඟ අත්සන් කර නොතිබුණි.

(ඊ) ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා වූ ජපන් බැංකුව විසින් මූලායනය කරන ලද ආදායම් නොලබන ජලය ව්‍යාපෘතිය (SLP -66) සාර්ථක නොවූ අතර පසුව ව්‍යාපෘතිය අවලංගු කර තිබුණි. ඉහත ව්‍යාපෘතිය සඳහා දරන ලද රු.මිලියන 172 ක උපදේශක ගාස්තු මහ කොළඹ පුනරුත්ථාපන ව්‍යාපෘතියට මාරු කර තිබුණි. එබැවින් මෙය මණ්ඩලයට සිදු වූ පාඩුවක් බවට නිරීක්ෂණය විය.

(උ) කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේ හා නැදුරාහේන ඉඩමේ ජල නළ එළීම සඳහා මණ්ඩලයට රු.මිලියන 3.88 ක අත්තිකාරම් ලැබී තිබුණද, 2013 දෙසැම්බර් 31 දක්වා දරන ලද රු.833,350 ක් වූ පොදුකාර්ය වියදම පමණක් ඒ සඳහා ලැබී තිබුණු අත්තිකාරමෙන් අඩුකර තිබුණි. කෙසේ වුවද ඒ සඳහා දරන ලද සෘජු වියදම පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) පාලන ගිණුම් සැසඳීම
(ආ) වත්කම් කළමනාකරණය
(ඇ) තොග පාලනය
(ඈ) ජර්නල් සටහන් ගිණුම් තැබීම පිළිබඳ පාලනය
(ඉ) ව්‍යාපෘති පරිපාලනය හා කාර්යසාධන සමාලෝචනය